ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையம்
National Disaster Relief Services Centre

විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை
Vidya Mawatha, Colombo 07, Sri Lanka

දු.අ. /தொ.எ / T.N. 0112665258
ෆැක්ස් / பெக்ஸ் / Fax 0112665702
වි.තැ. / மி.அ.மு. / Email sahana.ndrsc@gmail.com

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | NDRSC/02/04/10 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.01. 21 |

ආපදා සහන සේවා චක්‍රලේඛ අංක 01/ 2025

අමාත්‍යාංශ ලේකම්වරු,

ප්‍රධාන ලේකම්වරු,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරු,

ප්‍රාදේශීය ලේකම්වරු,

<u>හදිසි ආපදා තත්ත්වයක දී විපතට පත්වන ජනතාවට හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම , හානියට පත්වන දේපළ යථා තත්ත්වයට පත් කිරීම සහ වන්දි ගෙවීම</u>

හදිසි ආපදා තත්ත්වයක දී විපතට පත්වන ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම, හානියට පත්වන දේපළ යථා තත්ත්වයට පත් කිරීම සහ වන්දි ගෙවීම අරමුණු කොට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර හදිසි ආපදා තත්ත්වයක දී විපතට පත්වන ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් සහන සැලසීම,පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම, හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම යන මැයෙන් මීට පෙර නිකුත් කර ඇති ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020, 01/2020(I) හා 01/2020 (II) මෙයින් අවලංගු කරනු ලැබේ.

02. මෙම චක්‍රලේඛය යටතේ හදිසි ආපදා ලෙස අර්ථකථනය කරනු ලබන්නේ ස්වභාවික ආපදා මගින් ඇතිවන නායයාමක්, සුළි සුළඟක්, ගංවතුරක්, නියඟයක්, සුනාමියක්, භූමි කම්පාවක්, ස්වභාවික ආපදාවක් හේතුවෙන් හටගන්නා ගින්නක්, චණ්ඩ මාරුතයක්, අකුණු සැර වැදීමක්, කුණාටුවක් හා එවන් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් හා/හෝ එහි ඍජු ප්‍රතිඵලයක් නිසා සිදුවන කිසියම් ආපදාවක්, කාර්මික උපද්‍රවයක්, පිපිරීමක්, රසායනික හෝ විකිරණශීලී හෝ න්‍යෂ්ඨික ආපදාවක්, ගුවන්, සමුද්‍රීය ජලය මත හෝ ජලය තුළ ඇතිවන ආපදා තත්ත්වයන්ය. මෙම ස්වාභාවික ආපදා හේතුකොට ගෙන සිදුකරන සියලුම තාවකාලික මහජනතාව ඉවත් කිරීම්, ඔවුන්ගේ ජීවිත හා දේපළ හානි සඳහා සහන සැලසීම හා වන්දි ලබාදීම මෙම චක්‍රලේඛය මත පදනම්ව සිදු කළ යුතුය.

03. ආපදා සහන සේවා චක්‍රලේඛ අංක 01/2025හි සඳහන් ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ දී එම චක්‍රලේඛය මත පදනම්ව සකස් කළ ආපදා සහන සේවා මාර්ගෝපදේශ අංක 01/2025 ලෙස හඳුන්වනු ලබන හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත්වන ජනතාවට හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම , හානියට පත්වන දේපළ යථා තත්ත්වයට පත් කිරීම සහ වන්දි ගෙවීම පිළිබඳ මාර්ගෝපදේශය, 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සහ තත්කාලයේ ශ්‍රී ලංකාවේ පවතින නීති රීති හා රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

04. ආපදාවකින් උද්ගතවන හදිසි තත්ත්වයන් කළමනාකරණය කිරීමේ වගකීම අදාළ අමාත්‍යාංශ වෙත පහත පරිදි පැවරෙනු ඇත.

| | |
|---|---|
| i. කඩිනම් ආපදා සහනාධාර සැපයීම<br>ii. නිවාස හා දේපළ හානි සඳහා වන්දි ලබාදීම<br>iii. ළමා නිවාස, වැඩිහිටි නිවාස, ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථාන හානි පූර්ණ කටයුතු | ආපදා කළමනාකරණ විෂයභාර අමාත්‍යාංශය |
| iv. ආපදාවකින් උද්ගතවන යටිතල පහසුකම්වල ප්‍රතිසංස්කරණ කටයුතු හා ආගමික ස්ථාන, රජයේ ගොඩනැගිලි, පොදු ගොඩනැගිලිවල ප්‍රතිසංස්කරණ කටයුතු<br>v. විවිධ අණ පනත්වලින් ආවරණය වන ආපදා සඳහා වන්දි | අදාළ රේඛීය අමාත්‍යාංශය |

## 05. කඩිනම් ආපදා සහනාධාර සැපයීම

5.1 හදිසි ආපදාවක දී විපතට පත්වූවන් සඳහා කඩිනමින් සහනාධාර සැලසීමට අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ආපදා කළමනාකරණ විෂයභාර අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලබන අතර, විපතට පත් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව එම ප්‍රතිපාදන ඔවුන් වෙත ආපදා කළමනාකරණ විෂයභාර අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් මුදා හරිනු ලැබේ. ආපදා අවස්ථාවල දී ප්‍රතිපාදන ලබා ගැනීම, සහනාධාර ලබා දීම හා සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය හා ඉදිරිපත් කළ යුතු ලියකියවිලි පිළිබඳව 01/2025 ආපදා සහන සේවා මාර්ගෝපදේශයේ සඳහන් වන අතර, ඒ අනුව කටයුතු කළ යුතුය.

**5.2** ඉහත 02 වන ඡේදයේ සඳහන් ස්වභාවික ආපදාවක දී විපතට පත්වන පවුල්/පුද්ගලයන් සඳහා පහත පරිදි කඩිනම් සහන සැලසීම සිදු කළ යුතු අතර, ඒ ඒ ආපදා අවස්ථාවන්හි දී ගෙවිය හැකි උපරිම සහනාධාර/වන්දි ප්‍රමාණයන් මේ සමග ඉදිරිපත් කරනු ලබන වගු අංක 01හි සඳහන් පරිදි විය යුතුය.

i. වගු අංක 01හි සඳහන් සියලුම සහන

ii.පානීය ජලය ලබාදීම

iii.කඩිනම් ප්‍රතිචාර කටයුතු

**06.** නිවාස හා දේපළ හානි සඳහා වන්දි ලබාදීම

**6.1** හදිසි ආපදා තත්ත්වයකින් විපතට පත් ජනතාව යළි නගා සිටුවීම යටතේ නිවාස හා දේපළ පහත දැක්වෙන පරිදි යථාවත් කිරීමට අදාළ ප්‍රතිපාදන ආපදා කළමනාකරණ විෂයභාර අමාත්‍යාංශය වෙත වෙන් කර දෙනු ලබන අතර, මේ සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල හානි ඇස්තමේන්තු පදනම් කොට ගෙන විපතට පත් ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව සහ නිවසෙහි ස්වභාවය මත පදනම්ව වන්දි ඔවුන් වෙත මුදා හැරිය යුතුය. ඒ ඒ ආපදා අවස්ථාවන්හි දී ගෙවිය හැකි උපරිම වන්දි ප්‍රමාණයන් වගු අංක 01හි සඳහන් පරිදි විය යුතුය.

i. නිවාස හා දේපළ හානිපූර්ණ කටයුතු
ii. රජයේ ලියාපදිංචි ළමා නිවාස, වැඩිහිටි නිවාස හා ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථාන හානිපූර්ණ කටයුතු

**6.2** මෙම චක්‍රලේඛයේ 02 වන ඡේදයේ සඳහන් කර ඇති ස්වභාවික ආපදාවක දී සිදුවන නිවාස හා දේපළ හානි, ළමා නිවාස, වැඩිහිටි නිවාස හා ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථානයන්ට වන දේපළ හානි, තක්සේරු වාර්තාව පදනම් කර ගෙන, වගු අංක 01හි පරිදි වෙන වෙනම ගණනය කොට අනුමත සීමාවන් තුළ ගෙවීම් කළ යුතුය.

**07.** නැවත පදිංචි කිරීම් වැඩසටහනට අදාලව සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සඳහා මෙම චක්‍රලේඛයේ නිවාස හානි සම්බන්ධ විධි විධාන අදාල නොවේ.

**08.** සහන සැලසීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය

i. ස්වභාවික ආපදා තත්ත්වයන් කළමනාකරණය කර ගැනීමට හා එබඳු ආපදා තත්ත්වයක දී විපතට පත්වූවන් සඳහා මෙන්ම, ආපදා අවදානම් තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් අවතැන්වන පුද්ගලයන් සඳහා ද, ඉතා කඩිනමින් සහන සැලසීමට ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරී(ආපදා සහන සේවා), ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය පියවර ගත යුතුය. පළාත් පාලන ආයතන

හා අනෙකුත් රාජ්‍ය ආයතන ආපදා තත්ත්වයන් කළමනාකරණය කර ගැනීමට මැදිහත්වීමේ දී දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව, ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව හා ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව සම්බන්ධීකරණය කරගනිමින් අදාළ කටයුතු සිදු කළ යුතුය.

ii. සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ආපදා තත්ත්වය ඇතිවීමත් සමඟ විපතට පත්වූවන් සඳහා කඩිනම් සහන සැලසීමට අවශ්‍ය කරන අත්තිකාරම් මුදල් කඩිනමින් ලබා ගැනීම සඳහා ආපදා සිද්ධි පිළිබඳ තත්ත්ව වාර්තාව (NDRSC 1/NDRSC1.2) සමඟ අවශ්‍ය අත්තිකාරම් මුදල් දිස්ත්‍රික් ලේකම් මගින් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කර, අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය.

iii. ආපදා තත්ත්වය සමනය වූ වහාම ආපදාවෙන් හානියට පත් වූ නිවාස හා ඒවායේ දේපළ සඳහා වන්දි ලබා දීමට, මෙම චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මාර්ගෝපදේශයෙහි සඳහන් උපදෙස් අනුව, ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ආපදා සිද්ධි පිළිබඳ තත්ත්ව වාර්තාව හා අදාළ සියලු විස්තර සමඟ අදාළ දිස්ත්‍රික් ලේකම් මගින් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කර, අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය.

iv. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ආපදා තත්ත්ව වාර්තා සම්බන්ධයෙන් ලේඛණයක් පවත්වා ගත යුතුය.

09. ආපදා සහන සේවා කටයුතුවල නිරත නිලධාරීන් හා තක්සේරු කමිටු නිලධාරීන් සඳහා ගෙවීම් කිරීමේ දී 01/2025 ආපදා සහන සේවා මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතුය.

10. ඕනෑම දිස්ත්‍රික්කයක ආපදා කළමනාකරණ සහ සහන සේවා කටයුතු සඳහා ලබා දී ඇති භාණ්ඩ හා උපකරණ අවස්ථානුකූලව වෙනත් ඕනෑම දිස්ත්‍රික්කයක සිදුවන ආපදාවක දී භාවිතා කිරීමට ලබා දිය යුතු අතර, ඒ සඳහා භාණ්ඩ ලබා දී ඇති අදාළ ආයතනයේ සහාය ඇතිව එය ඉටු කළ යුතුය. ආපදාවෙන් අනතුරුව නැවත එම භාණ්ඩ යථා පරිදි අදාළ දිස්ත්‍රික්කයට නැවත භාරදිය යුතුය.

11. මෙම චක්‍රලේඛය අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප 24/2227/803/002 හා 2024.12.13 දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මත ආරක්ෂක අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අතර, ප්‍රතිලාභීන්ට සහන සැලසීම මේ සමඟ නිකුත් කරනු ලබන 01/2025 ආපදා සහන සේවා මාර්ගෝපදේශයේ උපදෙස් අනුව සිදු කළ යුතුය.

12. මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන හදිසි ආපදා අවස්ථාවක දී, ආපදාවේ ස්වභාවය මත පදනම්ව අමාත්‍ය මණ්ඩලය ගනු ලබන තීරණ අනුව, අදාළ සුදුසු උපදෙස් මහා භාණ්ඩාගාරය/අදාළ විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරනු ඇත.මෙම චක්‍රලේඛය මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත නිකුත් කරන අතර යම්කිසි පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම් ආපදා කළමනාකරණ අංශයේ විෂයේ නියුතු අතිරේක ලේකම් විමසිය යුතුය.

**එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)**

ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,

එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,

එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී

**ලේකම්**

**ආරක්ෂක අමාත්‍යාංශය**

<u>පිටපත්:</u>

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
6. ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
7. විගණකාධිපති

(4–7) අදාළ වන පරිදි නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කිරීම සඳහා

වගු අංක 01

| ආපදා සහන වර්ගය | අංකය | සහනාධාර වර්ග | ගෙවිය යුතු ප්‍රමාණය (රුපියල්) | අදාළ අමාත්‍යාංශය |
|---|---|---|---|---|
| | (i) | පුද්ගල ජීවිත හානි වන්දි අත්තිකාරම් මුදල (අවමංගල්‍ය කටයුතු සඳහා)<br>පුද්ගල ජීවිත හානි වන්දි මුළු මුදල (උපරිමය) | 50,000<br>950,000<br>1,000,000 | |
| | | පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීමේ වන්දි | 1,000,000 | |
| | (ii) | <u>පිසූ ආහාර</u><br>එක් පුද්ගලයෙකු සඳහා දිනකට දීමනාව(වේලකට උපරිමය රු.200/-) | 600 | |
| | (iii) | ගැබිණි මවුවරුන්ට සහ දරුවෙකුගේ කිරි තේ වේලක් සඳහා (දිනකට තේ වේල් 02ක් පමණි) | 60 | |
| | (iv) | අනෙක් සියළු පුද්ගලයන්ට එක් තේ වේලක් සඳහා (දිනකට තේ වේල් 02 ක් පමණි) | 15 | |
| කඩිනම් සහන | (v) | සෞඛ්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය වෙනුවෙන් එක් පුද්ගලයෙකු සඳහා (එක් වතාවක් පමණක්) | 100 | ආපදා කළමනාකරණ විෂයභාර අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් හරහා ක්‍රියාත්මක කළ යුතුය |
| | (vi) | <u>වියළි ආහාර ද්‍රව්‍ය සඳහා මුදල්</u><br>(සතියක් සඳහා උපරිමය - නමුත් දිනකට උපරිමය මෙම මුදලින් 1/7 ක් විය යුතුය)<br>තනි පුද්ගලයෙකු සඳහා | 1,800 | |
| | (vii) | සාමාජිකයින් 02කින් යුත් පවුලකට | 2,400 | |
| | (viii) | සාමාජිකයින් 03කින් යුත් පවුලකට | 2,800 | |
| | (ix) | සාමාජිකයින් 04කින් යුත් පවුලකට | 3,200 | |
| | (x) | සාමාජිකයින් 05ක් හෝ ඊට වැඩි පවුලකට | 3,600 | |
| | (xi) | පූර්ණ හානියට පත්වන නිවාස සඳහා උපරිමය මාස 06ක් දක්වා නිවාස කුලී දීමනාව (එක් මාසයක් සඳහා) | 10,000 | |
| | (xii) | නිවාස හා දේපළ හානි සහ ගෘහ උපකරණ හානි සඳහා වන්දි (උපරිමය) (ගෘහ උපකරණ හානි සඳහා උපරිමය රු.25,000/-කි) | 2,500,000 | |

| | | | | |
|---|---|---|---|---|
| නිවාස හා දේපළ හානි | (xiii) | රජයේ ලියාපදිංචි ළමා නිවාස, වැඩිහිටි නිවාස හා ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථාන සඳහා දේපළ හානි සහ ගෘහ උපකරණ හානි සඳහා වන්දි (උපරිමය) (ගෘහ උපකරණ හානි සඳහා උපරිමය රු.25,000/-කි) | 2,500,000 | |
| සුරක්ෂිත මධ්‍යස්ථාන සඳහා උපයෝගිතා සේවාවන් සැපයීම | (xiv) | ආපදාව පවතින කාලසීමාවට අදාළව සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි ජල හා විදුලි බිල්පත් ගෙවීම | ආපදාව පවතින කාලසීමාවට පෙර මාස 02ක විදුලි/ජල බිල්පත් සලකා ආපදාව පැවැති කාලයට අනුරූපව වැඩි වී ඇති ගාස්තුව පමණක් ගෙවනු ලැබේ. | |
| ආපදා යටිතල පහසුකම් යථාවත් කිරීම | (xv) | අදාළ යටිතල පහසුකම්වල ප්‍රතිසංස්කරණ කටයුතු හා විවිධ අණපනත්වලින් ආවරණය වන ආපදා සඳහා වන්දි | පවත්නා ප්‍රතිපාදන හෝ අතිරේක ප්‍රතිපාදන | අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතුය |